## පළමුවන කියැවීම

ක්‍රියා 4:32-35

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයකි.

**සැමදෙනා එක්සත්ව, එක්සිත්ව සිටියහ.**

එකල සැදැහැවත් සමූහයා එක්සත්ව, එක්සිත්ව සිටියහ. තමන් සතු දෙයින් කිසිවක් තමාගේ ම යයි කිසිවෙක් නොකීහ. සියල්ල පොදුවේ තබාගත්හ. ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පුනර්ජීවනය ගැන අපෝස්තුළුවරුන් ප්‍රබල ලෙස සාක්ෂි දුන්හ. ඔවුන් සියල්ලන් කෙරෙහි දේව වරප්‍රසාදය බහුල ව පැවැතිණි. අග හිඟ ඇති කිසිවෙක් ඔවුන් අතරේ නොවූහ. මන්ද, වතු පිටි හෝ ගෙවල් හෝ අයිතිකරුවෝ ඒවා විකුණා, එයින් ලත් මුදල් ගෙනැවිත් අපෝස්තුළුවරුන්ගේ පාමුල තැබූහ. ඒ මුදල එකිනෙකාගේ වුවමනාවේ හැටියට බෙදුදෙන ලදී.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 118:1-2, 16-17, 22-23

පිළිතුර: **සමිඳුණෝ යහපත් නිසා අපි එතුමන්ට තුති පුදමු. ආලේලූයා! ආලේලූයා!**

ගීය: සමිඳුන්ට ස්තුති කරන්න, මන්ද එතුමාණෝ යහපත්ය. එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය.

"එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය"යි ඊශ්‍රායෙල් දූන් කියත්වා.
"එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය"යි ආරොන්ගේ වංශය දූන් කියත්වා.

"එතුමන්ගේ තිර පෙම සදාකාලයටම පවත්නේය"යි එතුමන් කෙරෙහි ගරු බිය ඇත්තෝ දූන් කියත්වා. වැටෙන පිණිස මම තදින් තල්ලු කරන ලදිමි. එහෙත් සමිඳුණෝ මට පිහිට වූ සේක. සමිඳුණෝ මාගේ සවිය ද ගීය ද වෙති. එතුමාණෝ මාගේ ගැළවුම්කාරයාණෝ ය.

ප්‍රීතිවීමේ හා ගැළවීමේ හඬට සවන් දෙන්න. දමිටුන්ගේ කූඩාරම්වල ජය නාදය දූන් ඇසේ. සමිඳුන්ගේ බාහු බලය විකුම් දක්වයි.

ගෘහ ශිල්පීන් ඉවත ලූ ගල ම මුල් ගල වී ඇත. මෙය සමිඳුන්ගේ ක්‍රියාවකි. එය අපේ දෙනෙතට අසිරිමත්ය. මෙන්න, සමිඳුන්ගේ ජය මංගල දිනය මෙදින අපි ප්‍රීති වෙමු. සන්තෝෂ වෙමු.

## දෙවන කියැවීම

1 ජුවාම් 5:1-6

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**දෙවියන් වහන්සේගෙන් උපන් සැම කෙනෙකුම ලෝකය ජයගෙන ඇත.**

ජේසුස් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ බව විශ්වාස කරන කවරෙක් නමුත් දෙවියන් වහන්සේගේ දරුවෙකි. පිය කෙනෙකුට ප්‍රේම කරන්නා ඔහුගෙන් උපන් පුත්‍රයාටත් ප්‍රේම කරයි. දෙවියන් වහන්සේට ප්‍රේම කිරීමෙන් ද, උන්වහන්සේගේ ආඥා පිළිපැදීමෙන් ද, අපි උන්වහන්සේගේ දරුවන්ට ප්‍රේම කරන බව දැනගනිමු. දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම යනු උන්වහන්සේගේ ආඥා පිළිපැදීම යි. උන්වහන්සේගේ ආඥා පිළිපැදීම දුෂ්කර නොවේ. මන්ද, දෙවියන් වහන්සේගෙන් උපන් හැම කෙනෙකුම ලෝකයෙන් ජයගෙන ඇත. ලෝකය පරදවන වික්‍රමය

නම් ඇදහිල්ලයි. ලෝකයෙන් ජයගත හැක්කේ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් යයි අදහන තැනැත්තාට මිස අන් කවරෙකුටද? ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ, ජලය හා රුධිරය කරණකොටගෙන පැමිණි තැනැන්වහන්සේ ය. එසේ පැමිණියේ ජලය පමණක් නොව, ජලයත් රුධිරයත් ඇතිවය. මෙය සත්‍යය බවට ආත්මයාණන් වහන්සේ සාක්ෂි දරන සේක. මන්ද, ආත්මයාණන් වහන්සේ සත්‍යය වන බැවිනි. දේව වාක්‍යය එසේ ය.

**<u>සාධුකාරය</u>**

ආලේලූයා! ආලේලූයා!
"තෝමස්, ඔබ මා දුටු බැවින් අදහා ගත්තෙහි ය.
නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය"යි
ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ජුවාම් 20:1- 9

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මළවුන්ගෙන් නැගිට වදාළ යුතුමය.**

සතියේ පළමු වනදා වූ එදා සවස ජුදෙව්වරුන්ට බියෙන් ශ්‍රාවකයන් දොරවල් වසාගෙන සිටි තැනට ජේසුස් වහන්සේ වැඩම කර ඔවුන් මැද සිට, "ඔබට ශාන්තිය වේවා!" යි වදාළ සේක. උන්වහන්සේ මෙසේ වදාරා තමන් අත් ද ඇලය ද ඔවුන්ට පෙන්වූ සේක. ශ්‍රාවකයෝ සමිඳාණන් වහන්සේ දුටු කල ප්‍රීතියෙන් පිනාගියහ. "ඔබට ශාන්තිය වේවා!" යි යළිත් උන්වහන්සේ ඔවුන්ට වදාරා "පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි" යි ඔවුන්ට කී සේක. උන්වහන්සේ ඉක්බිති ඔවුන් පිට හුස්ම හෙළා, "ශුද්ධාත්මයාණන් පිළිගන්න; ඔබ යමෙකුගේ පව් කමා කරන්නහු ද, ඒවා ඔවුන්ට කමා කරනු ලැබේ; ඔබ යමෙකුගේ පව් කමා නොකරන්නහු ද, ඒවා කමා නොකරනු ලැබේය" යි ඔවුන්ට වදාළ සේක. ජේසුස් වහන්සේ වැඩිය කල, දොළොස් දෙනාගෙන් එක් කෙනෙක්වූ 'නිවුන් දරුවා' යයි නම් ලත් තෝමස් ඔවුන් සමඟ නොසිටියේය. එහෙයින් සෙසු ශ්‍රාවකයෝ, "අපි සමිඳාණන් වහන්සේ දුටිමු" යි ඔහුට කීහ. එහෙත් ඔහු කතා කොට, "උන්වහන්සේගේ අත්වල ඇණ කැළැල් දැක, ඇණ ගසා තිබූ තැන්වල මාගේ ඇඟිල්ල තබා, උන්වහන්සේගේ ඇලයෙහි මාගේ අත දමා බැලුවොත් මිස, නැත්නම් විශ්වාස නොකරමි" යි කීය. අට දවසකට පසු උන්වහන්සේගේ ශ්‍රාවකයෝ නිවස තුළට වී සිටියෝය. තෝමස් ද ඔවුන් සමඟ සිටියේය. දොරවල් වසා තිබිණි. එහෙත්, ජේසුස් වහන්සේ පැමිණ, ඔවුන් මැද වැඩ සිට: "ඔබට ශාන්තිය වේවා!" යි වදාළ සේක. ඉන්පසු උන්වහන්සේ තෝමස් අමතා, "ඔබේ ඇඟිල්ල මෙහි බහා මාගේ අත් බලන්න; ඔබේ අත දිගු කර මාගේ ඇලයෙහි තබන්න. අවිශ්වාස නොකර විශ්වාස කරන්නැ" යි වදාළ සේක. තෝමස් පිළිතුරු දෙමින්, "මාගේ ස්වාමීනි, මාගේ දෙවියෙනි" යි උන්වහන්සේට කීය. එවිට ජේසුස් වහන්සේ, "ඔබ මා දුටු බැවින් අදහාගත්තෙහිය. නුදුටු නමුත් අදහන්නෝ භාග්‍යවන්තයෝ ය" යි වදාළ සේක. මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් ඉදිරියෙහි සිදු කළ සේක. එහෙත් මේවා ලියන ලද්දේ, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍ර වන ක්‍රිස්තුවරයාණන් බව ඔබ අදහාගන්නා පිණිසත්, ඇදහීමෙන් ජීවනය ලබන පිණිසත්ය. සුවිශේෂ වාක්‍යය එසේ ය.